## 01. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයෙන් උපකරණ ලබා ගැනීමේදී අවශ්‍ය උපදෙස්

1. උපකරණ නිකුත් කරනු ලබන්නේ ශ්‍රී පාලි මණ්ඩපයේ සේවය කරන කථිකාචාර්යවරයෙකු, නිලධාරියෙකු, හෝ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු භාරයේ පමණි.
2. උපකරණ ලබා දෙන්නේ විද්‍යාර්ථීන්ගේ **විෂයානුබද්ධ අධ්‍යයන කටයුතු** සඳහා පමණි.
3. විෂය බාහිර කටයුතු සඳහා අංශාධිපතිවරයාගේ නිර්දේශය සහ මණ්ඩපාධිපතිවරයාගේ අවසරය ලබා ගත යුතු ය.
4. බාහිර රූ ගත කිරීම් සඳහා කැමරා උපකරණ ලබා ගැනීම (Camera CALL SHEET), මැදිරි රූගත කිරීම් (Studio Bookings) සහ සංස්කරණ මැදිරිය (Editing Bookings) ලබා ගැනීම සඳහා වෙන වෙනම අදාළ ඉල්ලුම්පත් අවම වශයෙන් සතියකට (දින 07) පෙර ඉදිරිපත් කළ යුතු ය (උපකරණ අයදුම් කළ හැකි වන්නේ එක දිගට දින 02ක් සඳහා පමණි).
5. උපකරණ නිසි පරිදි ක්‍රියාත්මක වන බවට රැගෙන යාමට පෙර පරීක්ෂා කළ යුතු වේ. උපකරණ නිසි පරිදි ක්‍රියාත්මක නොකරන්නේ නම් හෝ භාවිතය අතරතුර අක්‍රිය වීමක් හෝ හානියක් සිදු වුවහොත් ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරි දැනුවත් කළ යුතු ය.
6. අදාළ ඉල්ලුම්පත නිවැරදිව පුරවා විෂයභාර කථිකාචාර්යවරයාගේ නිර්දේශය සහිතව ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සමායෝජක වෙත යොමු කළ යුතු අතර එම අනුමැතිය සහිතව ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ තාක්ෂණික නිලධාරි වෙත ලබා දිය යුතු ය.
7. උපකරණ ලබා ගත හැකි වන්නේ වැඩ කරන සතියේ දිනවල පමණක් වන අතර විශේෂ අවස්ථාවල අදාළ නිලධාරීන්ගේ එකගතාවෙන් හා අංශ ප්‍රධානීන්ගේ නිර්දේශය මත නිවාඩු දිනවල උපකරණ ලබා ගත හැකි ය.
8. උපකරණ ආයතනයෙන් පිටතට ගෙන යා හැක්කේ තාක්ෂණික නිලධාරි හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සේවකයෙකුගේ භාරකාරත්වය යටතේ පමණි. ඒ සඳහා නියෝජ්‍ය/සහකාර ලේඛකාධිකාරිගේ අවසර පත්‍රයක් ලබාගත යුතු ය.
9. කැමරා උපකරණ බැහැරට ගෙන යාමේදී ආයතනයේ වාහන හෝ උචිත වාහන පමණක් භාවිත කළ යුතු ය. (ත්‍රී රෝද රථ, මෝටර් සයිකල් මගින් කිසිදු උපකරණයක් ප්‍රවාහනයට අවසර දෙනු නොලැබේ).
10. උපකරණ භාවිත කිරීමෙන් පසු පිළිවෙලට හා පිරිසිදුව නැවත භාර දිය යුතු ය.
11. කැමරා උපකරණ ක්‍රියා කරවීමට අවසර ලබා දෙන්නේ රූපවාහිනී මාධ්‍ය විෂයන් සහ සිනමා විෂයන් හදාරන සිසුන්ට පමණි.
12. ඉල්ලුම් කළ වේලාවට (Booking time) උපකරණ ලබා ගැනීමට හා රූගත කිරීම් සඳහා පැමිණීමට කටයුතු කළ යුතුය. රූගත කිරීම් අවසන් කිරීමේ වේලාව සැලසුම් කල වේලාවට වඩා ප්‍රමාද වන්නේ නම් අංශාධිපතිවරයාගේ/ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සමායෝජකගේ අවසරය සහ උපකරණ භාරව යන නිළධාරියාගේ කැමැත්ත මත තව දුරටත් රූගත කිරීම් සිදු කළ හැකි වේ.

## 02. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ මැදිරි (Studio, Editing & Color grading) භාවිත කිරීම පිළිබඳ උපදෙස්

1. ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයට පාවහන් ගලවා ඇතුළු විය යුතු ය. (සංයුක්ත උපාංග දූහුවිලි මඟින් හානි වන බැවිනි)
2. මැදිරි තුළට කිසිදු ආහාර ද්‍රව්‍යක් හෝ පාන වර්ගයක් රැගෙන යාම නොකළ යුතු ය.
3. රූගත කිරීමට හෝ සංස්කරණයට අදාළ නොවන අය මැදිරි තුළට කැඳවාගෙන නොඑන්න.
4. උපකරණ ක්‍රියාත්මක කිරීමට ගැටළු ඇත්නම් තාක්ෂණික නිලධාරිගේ සහය ලබා ගන්න.
5. භාවිත කිරීමෙන් පසු සියලු උපකරණ නිසි තැන්වල ස්ථාන ගත කරන්න.
6. මණ්ඩපයෙන් පිට ශිල්පියෙකු මැදිරිය තුළ වැඩ කටයුත්තකට සම්බන්ධ කර ගනී නම් අංශාධිපතිවරයාගේ/ ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සමායෝජකගේ නිර්දේශය මත සිදු කළ යුතු ය.
7. මැදිරි වෙන් කර ගැනීමට අදාළ ඉල්ලුම්පත නිවැරදිව පුරවා විෂයභාර කථිකාචාර්යවරයාගේ නිර්දේශය සහිතව ශ්‍රව්‍ය දෘශ්‍ය ඒකකයේ සමායෝජක වෙත යොමු කළ යුතු අතර එම අනුමැතිය සහිතව ශ්‍රව්‍ය දෘශ්‍ය තාක්ෂණික නිලධාරි වෙත ලබා දිය යුතු ය.
8. මැදිරි වෙන් කරගත හැකිවන්නේ වැඩ කරන සතියේ දිනවල පමණක් වන අතර විශේෂ අවස්ථාවල අදාළ නිලධාරීන්ගේ එකගතාවෙන් හා අංශ ප්‍රධානින්ගේ නිර්දේශය මත, නිවාඩු දිනයන්හිදී එම පහසුකම් ලබා ගත හැකිය.
9. මැදිරි ඉල්ලුම් කළ හැක්කේ වරකට දින 02ක කාල සීමාවකට පමණි.
10. ඉල්ලුම් කළ වේලාවට (Booking time) පැමිණීමට ප්‍රමාද වුවහොත් එම වේලාවෙන් පැයකට පසුව, අවලංගු කිරීම හෝ වෙනත් කෙනෙකුට එම Booking එක ලබා දීමට සිදු වේ.